# සාරාංශය


රැකියා සොයා විදේශ ගත වන ශ්‍රී ලාංකීය කාන්තාවන්ගේ සංඛ්‍යාව වසරින් වසර ඉහළ යමින් පවතින බව සංඛ්‍යා ලේඛන තුළින් තහවුරුවේ. 1977 සිට 2003 වසර දක්වා වූ කාලය තුළ රැකියාවන් සොයා විදේශගත වූ කාන්තාවන්ගේ සංඛ්‍යාව 220 සිට 134,322 දක්වා ඉහළ ගොස් තිබේ. 2003 වසර වන විට විදේශ රැකියාවන් සඳහා පිටත්ව ගිය ශ්‍රමිකයින්ගෙන් 64% ක් කාන්තාවන් විය. මෙසේ විදේශගත වන කාන්තාවන්ගෙන් විශාල ප්‍රමාණයක් මව්වරුන් වන බැවින්, එම මව්වරුන් විදේශගත වීම නිසා ඔවුන්ගේ දරුවන් මුහුණපාන බොහෝ ගැටලු පවතී.

නව යොවුන් විය පුද්ගලයෙකුගේ ජීවිතයේ වැදගත්ම පරිවර්තන කාල පරිච්ඡේදයක් සේ සැලකේ. පුද්ගලයකු නව යොවුන් වියේ දී මුහුණපාන ගැටලු ඔහුගේ පසුකාලීන ජීවිතයට විශාල බලපෑමක් එල්ල කළ හැකිය. එබැවින් මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ තම මව්වරුන් විදේශ රැකියා සඳහා යාම හේතුවෙන් නව යොවුන් වියේ පසුවන ඔවුන්ගේ දරුවන් මුහුණපාන අධ්‍යාපනික හා සමාජීය ගැටලු හඳුනා ගැනීමයි. මව්වරුන් විදේශ රැකියා සඳහා යාම හා ළමුන්ගේ විෂය සාධනය අතර ඇති සම්බන්ධතාව සහ පාසල් පැමිණීම අතර ඇති සම්බන්ධතාව හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ අනෙකුත් අරමුණු අතර වේ. තම මව්වරුන් රැකියා සඳහා විදේශ ගතව සිටින නව යොවුන් වියේ ළමුන් මුහුණපාන ගැටලු විසඳීම සඳහා ගත හැකි පිළියම් යෝජනා කිරීමට ද මෙම අධ්‍යයනයෙන් බලාපොරොත්තු වේ.

සමීක්ෂණ පර්යේෂණ ක්‍රමයට අනුව කරනු ලැබූ මෙම අධ්‍යයනයේ දී නියැදිය වශයෙන් යොදා ගන්නා ලද්දේ බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල අධ්‍යාපන කලාපයේ පාසල් හයක 9 - 11 ශ්‍රේණිවල ඉගෙනුම ලබන, තම මව්වරුන් රැකියා සඳහා විදේශගතව සිටින ළමුන් 50 දෙනෙකි.

මෙහි පළමුවන පරිච්ඡේදයෙන් මව්වරුන් රැකියා සඳහා විදේශගත වීම හේතුවෙන් මතුව ඇති ගැටලුවේ ස්වභාවයත්, එම ගැටලුව අධ්‍යයනයේ ඇති වැදගත්

කමත් පිළිබඳව කරුණු ඉදිරිපත් කර තිබේ. එම ගැටලුව හා බැඳුණු සමාජ, ආර්ථික හා මනෝ විද්‍යාත්මක පසුබිම හා ඒ සම්බන්ධයෙන් මෙතෙක් සිදුකොට ඇති අධ්‍යයනයන් පිළිබඳ සාහිත්‍ය විමර්ශනයක් දෙවන පරිච්ඡේදය මගින් ඉදිරිපත් කර තිබේ.

මෙහි තුන්වන පරිච්ඡේදය වෙන් කර ඇත්තේ අධ්‍යයන ක්‍රමවේදය විස්තර කිරීම සඳහාය. එහිදී මෙම අධ්‍යයනය සඳහා නියදිය තෝරා ගත් ආකාරය පිළිබඳවත්, දත්ත රැස්කිරීම සඳහා යොදා ගත් උපකරණ හා ක්‍රම ශිල්ප පිළිබඳවත් විස්තර ඉදිරිපත් කර ඇති අතර දත්ත රැස් කිරීම සඳහා යොදා ගත් උපකරණයන් උපලේඛනයන් ලෙස ඉදිරිපත් කර තිබේ. තවද මෙම අධ්‍යයනයේ දී පර්යේෂණ ආචාර ධර්ම සුරැකීමට ගත් උත්සාහය පිළිබඳව හා මෙම අධ්‍යයනයේ සීමාවන් පිළිබඳව ද මෙම පරිච්ඡේදයෙන් විස්තර කර තිබේ.

මෙම අධ්‍යයනයේ දී රැස් කර ගනු ලැබූ දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය කිරීම වෙනුවෙන් හතර වන පරිච්ඡේදය වෙන් කර තිබේ. දත්ත විශ්ලේෂණය සඳහා වගු, ප්‍රතිශත හා ප්‍රස්තාර භාවිත කර ඇත.

පස් වන පරිච්ඡේදයෙන් මෙම අධ්‍යයනය තුළින් එළඹිය හැකි නිගමනයන් හා එයට අදාළව ගත හැකි පිළියම් පිළිබඳ යෝජනාත් ඉදිරිපත් කර තිබේ. එසේම අනාගත පර්යේෂකයින් සඳහා වන යෝජනාවන්ද මෙම පරිච්ඡේදයට ඇතුළත් කර තිබේ.